# ඇගයීම් වාර්තාව

## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2010

# 11 - බුද්ධ ධර්මය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

## ඇගයීම් වාර්තාව

## 11 - බුද්ධ ධර්මය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

## බුද්ධ ධර්මය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහාය. ජාතික මට්ටමින් පවත්වන මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබාගන්නා සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික මෙන් ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එකසේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙය වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙහි I කොටසෙහි ඇතුළත් වේ. II වන කොටසෙහි පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනාවලින් සමන්විත වේ.

III වන කොටසෙහි, පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව ඔබට මෙයින් යම් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මකබව වැඩි දියුණුව සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලා සිටිමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එම කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

2011 ඔක්තෝම්බර් 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | අනුර එදිරිසිංහ මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | කේ.ඒ.එච්.එච්. කුරුප්පු මිය<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | එන්.පී. විජයපාල මයා<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/ජය/විද්‍යාකර බාලිකා විදුහල<br>මහරගම |
| | | ඩබ්.ඒ.එන්. ද සිල්වා මිය<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/කො/දේවි බාලිකා විදුහල<br>කොළඹ 08 |
| | | කේ.කේ.ජී.සී. පුෂ්පලතා මිය<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/ගම්/ගෝතමී විදුහල<br>ගම්පහ |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඩබ්.ඒ.ඩී. චතුරිකා දිසානායක මෙනවිය<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යූහය 11
2.1.2. I ප්‍රශ්න පත්‍රය 12
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 17

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යූහය 18
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 19

## III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 28

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 29

## I කොටස

# 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 විෂය අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

★ පරිසරය තුළින් වින්දන ශක්තියක් ලබා ගැනීම

★ නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය

★ ඵලදායී දිවිපැවැත්මට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය

★ දේශීය අනන්‍යතාවය හඳුනාගැනීම හා අගය කිරීම

★ විචාර ශක්තිය වර්ධනය

★ විවේක කාලය අර්ථවත් කරගැනීමට

★ දැනුම කුසලතාවලින් යුතු පුද්ගලයන් පමණක් නොව මානව හිතවාදී නිර්මාණාත්මක චින්තනයෙන් හෙබි සංවේදී රසිකත්වයක් ඇති පුරවැසියකු බිහි කිරීම

★ පාසල් ශිෂ්‍යයාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසු කාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මය හා නිපුණතා වර්ධනය කරගැනීම

## 1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 225,906 | 5,831 | 231,737 |
| දෙමළ | 0 | 0 | 0 |
| ඉංග්‍රීසි | 43 | 620 | 663 |
| එකතුව | **225,949** | **6,451** | **232,400** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 67, 985 | 30.09 | 730 | 11.32 | 68,715 | 29.57 |
| B | 28,246 | 12.50 | 831 | 12.88 | 29,077 | 12.51 |
| C | 44,364 | 19.63 | 1,769 | 27.42 | 46,133 | 19.85 |
| S | 42,459 | 18.79 | 1,955 | 30.31 | 44,414 | 19.11 |
| W | 42,895 | 18.98 | 1,166 | 18.07 | 44,061 | 18.96 |
| එකතුව | **225,949** | **100.00** | **6,451** | **100.00** | **232,400** | **100.00** |

වගුව 2

1.2.3. පළමු වතාවට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 21374 | 9357 | 43.78 | 2608 | 12.20 | 3324 | 15.55 | 3097 | 14.49 | 18386 | 86.02 | 2988 | 13.98 |
| 2. ගම්පහ | 17637 | 5830 | 33.06 | 2117 | 12.00 | 3347 | 18.98 | 3055 | 17.32 | 14349 | 81.36 | 3288 | 18.64 |
| 3. කළුතර | 11837 | 4422 | 37.36 | 1540 | 13.01 | 2082 | 17.59 | 1878 | 15.87 | 9922 | 83.82 | 1915 | 16.18 |
| 4. මහනුවර | 14832 | 4904 | 33.06 | 1890 | 12.74 | 2816 | 18.99 | 2507 | 16.90 | 12117 | 81.69 | 2715 | 18.31 |
| 5. මාතලේ | 5452 | 1686 | 30.92 | 707 | 12.97 | 981 | 17.99 | 918 | 16.84 | 4292 | 78.72 | 1160 | 21.28 |
| 6. නුවරඑළිය | 4741 | 1257 | 26.51 | 600 | 12.66 | 903 | 19.05 | 867 | 18.29 | 3627 | 76.50 | 1114 | 23.50 |
| 7. ගාල්ල | 14817 | 5116 | 34.53 | 1693 | 11.43 | 2425 | 16.37 | 2324 | 15.68 | 11558 | 78.00 | 3259 | 22.00 |
| 8. මාතර | 11277 | 4032 | 35.75 | 1292 | 11.46 | 1971 | 17.48 | 1790 | 15.87 | 9085 | 80.56 | 2192 | 19.44 |
| 9. හම්බන්තොට | 9114 | 2848 | 31.25 | 1116 | 12.24 | 1539 | 16.89 | 1532 | 16.81 | 7035 | 77.19 | 2079 | 22.91 |
| 10. යාපනය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 12. මන්නාරම | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 13. වව්නියාව | 157 | 36 | 22.93 | 20 | 12.74 | 37 | 23.57 | 34 | 21.66 | 127 | 80.89 | 30 | 19.11 |
| 14. මුලතිව් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 15. මඩකලපුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 16. අම්පාර | 4118 | 964 | 23.41 | 498 | 12.09 | 804 | 19.52 | 830 | 20.16 | 3096 | 75.18 | 1022 | 24.82 |
| 17. ත්‍රිකුණාමලය | 1493 | 286 | 19.16 | 207 | 13.86 | 303 | 20.29 | 291 | 19.49 | 1087 | 72.81 | 406 | 27.19 |
| 18. කුරුණෑගල | 19424 | 7021 | 36.15 | 2605 | 13.41 | 3341 | 17.20 | 3307 | 17.03 | 16274 | 83.78 | 3150 | 16.22 |
| 19. පුත්තලම | 4285 | 1275 | 29.75 | 491 | 11.46 | 772 | 18.02 | 885 | 20.65 | 3423 | 79.88 | 862 | 20.12 |
| 20. අනුරාධපුරය | 11021 | 2913 | 26.43 | 1370 | 12.43 | 2022 | 18.35 | 2052 | 18.62 | 8357 | 75.83 | 2664 | 24.17 |
| 21. පොළොන්නරුව | 5124 | 1478 | 28.84 | 548 | 10.69 | 987 | 19.26 | 913 | 17.82 | 3926 | 76.62 | 1198 | 23.38 |
| 22. බදුල්ල | 9781 | 2885 | 29.50 | 1193 | 12.20 | 1873 | 19.15 | 1795 | 18.35 | 7746 | 79.19 | 2035 | 20.81 |
| 23. මොනරාගල | 6969 | 1547 | 22.20 | 781 | 11.21 | 1177 | 16.89 | 1368 | 19.63 | 4873 | 69.92 | 2096 | 30.08 |
| 24. රත්නපුරය | 13732 | 4312 | 31.40 | 1694 | 12.34 | 2496 | 18.18 | 2208 | 16.08 | 10710 | 77.99 | 3022 | 22.01 |
| 25. කෑගල්ල | 9515 | 3194 | 33.57 | 1267 | 13.32 | 1756 | 18.46 | 1630 | 17.13 | 7847 | 82.47 | 1668 | 17.53 |
| **සමස්ත දිවයින** | **196700** | **65363** | **33.23** | **24237** | **12.32** | **34956** | **17.77** | **33281** | **16.92** | **157837** | **80.24** | **38863** | **19.76** |

වගුව 3

## 1.2.4 පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 7399 | 4128 | 55.79 | 767 | 10.37 | 941 | 12.72 | 783 | 10.58 | 6619 | 89.46 | 780 | 10.54 |
| 2. හෝමාගම | 3221 | 1004 | 31.17 | 405 | 12.57 | 558 | 17.32 | 593 | 18.41 | 2560 | 79.48 | 661 | 20.52 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 6239 | 2463 | 39.48 | 821 | 13.16 | 1038 | 16.64 | 995 | 15.95 | 5317 | 85.22 | 922 | 14.78 |
| 4. පිළියන්දල | 4515 | 1762 | 39.03 | 615 | 13.62 | 787 | 17.43 | 726 | 16.08 | 3890 | 86.16 | 625 | 13.84 |
| 5. ගම්පහ | 6284 | 2504 | 39.85 | 815 | 12.97 | 1123 | 17.87 | 942 | 14.99 | 5384 | 85.68 | 900 | 14.32 |
| 6 මිනුවන්ගොඩ | 4094 | 1195 | 29.19 | 469 | 11.46 | 782 | 19.10 | 784 | 19.15 | 3230 | 78.90 | 864 | 21.10 |
| 7. මීගමුව | 2202 | 561 | 25.48 | 244 | 11.08 | 440 | 19.98 | 461 | 20.94 | 1706 | 77.48 | 496 | 22.52 |
| 8. කැලණිය | 5057 | 1570 | 31.05 | 589 | 11.65 | 1002 | 19.81 | 868 | 17.16 | 4029 | 79.67 | 1028 | 20.33 |
| 9. කළුතර | 5363 | 1960 | 36.55 | 699 | 13.03 | 951 | 17.73 | 813 | 15.16 | 4423 | 82.47 | 940 | 17.53 |
| 10. මතුගම | 2672 | 1030 | 38.55 | 301 | 11.26 | 488 | 18.26 | 422 | 15.79 | 2241 | 83.87 | 431 | 16.13 |
| 11. හොරණ | 3802 | 1432 | 37.66 | 540 | 14.20 | 643 | 16.91 | 643 | 16.91 | 3258 | 85.69 | 544 | 14.31 |
| 12. නුවර | 5473 | 2620 | 47.87 | 672 | 12.28 | 902 | 16.48 | 680 | 12.42 | 4874 | 89.06 | 599 | 10.94 |
| 13. දෙනුවර | 1642 | 311 | 18.94 | 184 | 11.21 | 326 | 19.85 | 368 | 22.41 | 1189 | 72.41 | 453 | 27.59 |
| 14. ගම්පොල | 2090 | 503 | 24.07 | 243 | 11.63 | 431 | 20.62 | 401 | 19.19 | 1578 | 75.50 | 512 | 24.50 |
| 15. තෙල්දෙනිය | 1692 | 355 | 20.98 | 220 | 13.00 | 342 | 20.21 | 345 | 20.39 | 1262 | 74.59 | 430 | 25.41 |
| 16. වත්තේගම | 1671 | 543 | 32.50 | 235 | 14.06 | 307 | 18.37 | 280 | 16.76 | 1365 | 81.69 | 306 | 18.31 |
| 17. කටුගස්තොට | 2264 | 572 | 25.27 | 336 | 14.84 | 508 | 22.44 | 433 | 19.13 | 1849 | 81.67 | 415 | 18.33 |
| 18. මාතලේ | 2347 | 938 | 39.97 | 303 | 12.91 | 412 | 17.55 | 345 | 14.70 | 1998 | 85.13 | 349 | 14.87 |
| 19. ගලේවෙල | 1977 | 517 | 26.15 | 259 | 13.10 | 342 | 17.30 | 357 | 18.06 | 1475 | 74.61 | 502 | 25.39 |
| 20. නාඋල | 546 | 117 | 21.43 | 78 | 14.29 | 118 | 21.61 | 96 | 17.58 | 409 | 74.91 | 137 | 25.09 |
| 21. විල්ගමුව | 582 | 114 | 19.59 | 67 | 11.51 | 109 | 18.73 | 120 | 20.62 | 410 | 70.45 | 172 | 29.55 |
| 22. නුවරඑළිය | 650 | 124 | 19.08 | 76 | 11.69 | 127 | 19.54 | 120 | 18.46 | 447 | 68.77 | 203 | 31.23 |
| 23. කොත්මලේ | 810 | 211 | 26.05 | 98 | 12.10 | 150 | 18.52 | 173 | 21.36 | 632 | 78.02 | 178 | 21.98 |
| 24. හැටන් | 774 | 230 | 29.72 | 90 | 11.63 | 161 | 20.80 | 147 | 18.99 | 628 | 81.14 | 146 | 18.86 |
| 25. වලපනේ | 1033 | 201 | 19.46 | 110 | 10.65 | 182 | 17.62 | 206 | 19.94 | 699 | 67.67 | 334 | 32.33 |
| 26. හඟුරන්කෙත | 1474 | 491 | 33.31 | 226 | 15.33 | 283 | 19.20 | 221 | 14.99 | 1221 | 82.84 | 253 | 17.16 |
| 27. ගාල්ල | 6173 | 2583 | 41.84 | 718 | 11.63 | 918 | 14.87 | 886 | 14.35 | 5105 | 82.70 | 1068 | 17.30 |
| 28. ඇල්පිටිය | 3181 | 869 | 27.32 | 361 | 11.35 | 603 | 18.96 | 533 | 16.76 | 2366 | 74.38 | 815 | 25.62 |
| 29. අම්බලන්ගොඩ | 3524 | 1146 | 32.52 | 363 | 10.30 | 576 | 16.35 | 561 | 15.92 | 2646 | 75.09 | 878 | 24.91 |
| 30. උඩුගම | 1939 | 518 | 26.71 | 251 | 12.94 | 328 | 16.92 | 344 | 17.74 | 1441 | 74.32 | 498 | 25.68 |
| 31. මාතර | 4793 | 2014 | 42.02 | 509 | 10.62 | 767 | 16.00 | 691 | 14.42 | 3981 | 83.06 | 812 | 16.94 |
| 32. අකුරැස්ස | 1925 | 736 | 38.23 | 249 | 12.94 | 352 | 18.29 | 277 | 14.39 | 1614 | 83.84 | 311 | 16.16 |
| 33. මුලටියන-හක්මණ | 2201 | 688 | 31.26 | 274 | 12.45 | 406 | 18.45 | 379 | 17.22 | 1747 | 79.37 | 454 | 20.63 |
| 34. මොරවක-දෙනියාය | 2358 | 594 | 25.19 | 260 | 11.03 | 446 | 18.91 | 443 | 18.79 | 1743 | 73.92 | 615 | 26.08 |
| 35. තංගල්ල | 2697 | 830 | 30.77 | 354 | 13.13 | 479 | 17.76 | 448 | 16.61 | 2111 | 78.27 | 586 | 21.73 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 3803 | 893 | 23.48 | 450 | 11.83 | 659 | 17.33 | 733 | 19.27 | 2735 | 71.92 | 1068 | 28.08 |
| 37. වලස්මුල්ල | 2614 | 1125 | 43.04 | 312 | 11.94 | 401 | 15.34 | 351 | 13.43 | 2189 | 83.74 | 425 | 16.26 |
| 38. යාපනය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 39. දූපත | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 41. වලිකාමන් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 44. මන්නාරම | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 45. මඩු | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 46. වව්නියාව | 157 | 36 | 22.93 | 20 | 12.74 | 37 | 23.57 | 34 | 21.66 | 127 | 80.89 | 30 | 19.11 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 48. මුලතිව් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 50. මඩකලපුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 51. කල්කුඩා | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 54. අම්පාර | 2483 | 675 | 27.18 | 307 | 12.36 | 503 | 20.26 | 469 | 18.89 | 1954 | 78.70 | 529 | 21.30 |
| 55. කල්මුනේ | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 56. සමන්තුරෙයි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 57. මහඔය | 504 | 83 | 16.47 | 37 | 7.34 | 104 | 20.63 | 127 | 25.20 | 351 | 69.64 | 153 | 30.36 |
| 58. දෙහිඅත්තකන්ඩිය | 1100 | 203 | 18.45 | 153 | 13.91 | 188 | 17.09 | 229 | 20.82 | 773 | 70.27 | 327 | 29.73 |
| 59. අක්කරෙයිපත්තුව | 31 | 3 | 9.68 | 1 | 3.23 | 9 | 29.03 | 5 | 16.13 | 18 | 58.06 | 13 | 41.94 |
| 60. ත්‍රිකුණාමලය | 419 | 80 | 19.09 | 64 | 15.27 | 87 | 20.76 | 74 | 17.66 | 305 | 72.79 | 114 | 27.21 |
| 61. මුතූර් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 62. කන්තලේ | 1024 | 197 | 19.24 | 138 | 13.48 | 206 | 20.12 | 206 | 20.12 | 747 | 72.95 | 277 | 27.05 |
| 63. කින්නියා | 50 | 9 | 18.00 | 5 | 10.00 | 10 | 20.00 | 11 | 22.00 | 35 | 70.00 | 15 | 30.00 |
| 64. කුරුණෑගල | 4391 | 1896 | 43.18 | 555 | 12.64 | 701 | 15.96 | 627 | 14.28 | 3779 | 86.06 | 612 | 13.94 |
| 65. කුලියාපිටිය | 3211 | 1220 | 37.99 | 419 | 13.05 | 526 | 16.38 | 555 | 17.28 | 2720 | 84.71 | 491 | 15.29 |
| 66. නිකවැරටිය | 2734 | 908 | 33.21 | 396 | 14.48 | 455 | 16.64 | 522 | 19.09 | 2281 | 83.43 | 453 | 16.57 |
| 67. මහව | 3434 | 1018 | 29.64 | 481 | 14.01 | 656 | 19.10 | 661 | 19.25 | 2816 | 82.00 | 618 | 18.00 |
| 68. ගිරිඋල්ල | 3162 | 1085 | 34.31 | 432 | 13.66 | 575 | 18.18 | 511 | 16.16 | 2603 | 82.32 | 559 | 17.68 |
| 69. ඉබ්බාගමුව | 2492 | 894 | 35.87 | 322 | 12.92 | 428 | 17.17 | 431 | 17.30 | 2075 | 83.27 | 417 | 16.73 |
| 70. පුත්තලම | 1900 | 521 | 27.42 | 223 | 11.74 | 363 | 19.11 | 413 | 21.74 | 1520 | 80.00 | 380 | 20.00 |
| 71. හලාවත | 2385 | 754 | 31.61 | 268 | 11.24 | 409 | 17.15 | 472 | 19.79 | 1903 | 79.79 | 482 | 20.21 |
| 72. අනුරාධපුරය | 3770 | 1157 | 30.69 | 473 | 12.55 | 648 | 17.19 | 656 | 17.40 | 2934 | 77.82 | 836 | 22.18 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. තඹුත්තේගම | 2191 | 546 | 24.92 | 280 | 12.78 | 374 | 17.07 | 426 | 19.44 | 1626 | 74.21 | 565 | 25.79 |
| 74. කැකිරාව | 2011 | 543 | 27.00 | 260 | 12.93 | 366 | 18.20 | 374 | 18.60 | 1543 | 76.73 | 468 | 23.27 |
| 75. ගලෙන්බිඳුනුවැව | 1331 | 304 | 22.84 | 159 | 11.95 | 272 | 20.44 | 254 | 19.08 | 989 | 74.31 | 342 | 25.69 |
| 76. කැබිතිගොල්ලෑව | 1718 | 363 | 21.13 | 198 | 11.53 | 362 | 21.07 | 342 | 19.91 | 1265 | 73.63 | 453 | 26.37 |
| 77. පොළොන්නරුව | 1421 | 482 | 33.92 | 171 | 12.03 | 259 | 18.23 | 210 | 14.78 | 1122 | 78.96 | 299 | 21.04 |
| 78. හිඟුරක්ගොඩ | 2212 | 663 | 29.97 | 227 | 10.26 | 393 | 17.77 | 401 | 18.13 | 1684 | 76.13 | 528 | 23.87 |
| 79. දිඹුලාගල | 1491 | 333 | 22.33 | 150 | 10.06 | 335 | 22.47 | 302 | 20.25 | 1120 | 75.12 | 371 | 24.88 |
| 80. බදුල්ල | 2652 | 849 | 32.01 | 317 | 11.95 | 488 | 18.40 | 484 | 18.25 | 2138 | 80.62 | 514 | 19.38 |
| 81. බණ්ඩාරවෙල | 2183 | 847 | 38.80 | 291 | 13.33 | 404 | 18.51 | 316 | 14.48 | 1858 | 85.11 | 325 | 14.89 |
| 82. මහියංගනය | 2057 | 494 | 24.02 | 216 | 10.50 | 384 | 18.67 | 400 | 19.45 | 1494 | 72.63 | 563 | 27.37 |
| 83. වැලිමඩ | 2177 | 546 | 25.08 | 293 | 13.46 | 454 | 20.85 | 417 | 19.15 | 1710 | 78.55 | 467 | 21.45 |
| 84. පස්සර | 712 | 149 | 20.93 | 76 | 10.67 | 143 | 20.08 | 178 | 25.00 | 546 | 76.69 | 166 | 23.31 |
| 85. මොණරාගල | 2147 | 454 | 21.15 | 237 | 11.04 | 390 | 18.16 | 433 | 20.17 | 1514 | 70.52 | 633 | 29.48 |
| 86. වැල්ලවාය | 3143 | 708 | 22.53 | 350 | 11.14 | 495 | 15.75 | 635 | 20.20 | 2188 | 69.62 | 955 | 30.38 |
| 87. බිබිල | 1679 | 385 | 22.93 | 194 | 11.55 | 292 | 17.39 | 300 | 17.87 | 1171 | 69.74 | 508 | 30.26 |
| 88. රත්නපුර | 5345 | 1898 | 35.51 | 647 | 12.10 | 923 | 17.27 | 828 | 15.49 | 4296 | 80.37 | 1049 | 19.63 |
| 89. බළන්ගොඩ | 2461 | 760 | 30.88 | 332 | 13.49 | 457 | 18.57 | 371 | 15.08 | 1920 | 78.02 | 541 | 21.98 |
| 90. නිවිතිගල | 2462 | 638 | 25.91 | 284 | 11.54 | 513 | 20.84 | 434 | 17.63 | 1869 | 75.91 | 593 | 24.09 |
| 91. ඇඹිලිපිටිය | 3464 | 1016 | 29.33 | 431 | 12.44 | 603 | 17.41 | 575 | 16.60 | 2625 | 75.78 | 839 | 24.22 |
| 92. කෑගල්ල | 4056 | 1608 | 39.64 | 500 | 12.33 | 697 | 17.18 | 617 | 15.21 | 3422 | 84.37 | 634 | 15.63 |
| 93. මාවනැල්ල | 2758 | 824 | 29.88 | 408 | 14.79 | 511 | 18.53 | 503 | 18.24 | 2246 | 81.44 | 512 | 18.56 |
| 94. දෙහිඕවිට | 2701 | 762 | 28.21 | 359 | 13.29 | 548 | 20.29 | 510 | 18.88 | 2179 | 80.67 | 522 | 19.33 |
| **සමස්ත දිවයින** | **196700** | **65363** | **33.23** | **24237** | **12.32** | **34956** | **17.77** | **33281** | **16.92** | **157837** | **80.24** | **38863** | **19.76** |

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්ත සංඛ්‍යාතය | සමුච්ත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 15876 | 6.83 | 232400 | 100.00 |
| 81 - 90 | 26191 | 11.27 | 216524 | 93.17 |
| 71 - 80 | 29037 | 12.49 | 190333 | 81.90 |
| 61 - 70 | 30591 | 13.16 | 16296 | 69.40 |
| 51 - 60 | 32587 | 14.02 | 130705 | 56.24 |
| 41 - 50 | 29584 | 12.73 | 98118 | 42.22 |
| 31 - 40 | 26728 | 11.50 | 68534 | 29.49 |
| 21 - 30 | 21425 | 9.22 | 41806 | 17.99 |
| 11 - 20 | 16951 | 7.29 | 20381 | 8.77 |
| 01 - 10 | 3408 | 1.47 | 3430 | 1.48 |
| 00 - 00 | 22 | 0.01 | 22 | 0.01 |

වගුව 5


ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- (31 - 40 අතර පරාසය ගතහොත්)

මෙම විෂයය සඳහා ලකුණු 31 - 40 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 26728කි. එය ප්‍රතිශතයක් වශයෙන් 11.50% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 68534ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 29.49%කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: ඉහත ප්‍රස්තාරය අනුව 1 වන ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 68% ක් පමණ වන අතර 13 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 29% පමණ වේ. ඒ අනුව පහසුතාව අඩුම ප්‍රශ්නය වශයෙන් 13 වන ප්‍රශ්නය දැක්විය හැකිය.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ප්‍රශ්න තෝරාගැනීමේ දී පිළිතුරු සැපයීම සඳහා 2 වන ප්‍රශ්නය 80% ක් පමණ තෝරාගෙන ඇති අතර, 31% ක් පමණ 3 වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි 1 වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. ප්‍රස්තාරයට අනුව, එම ලකුණු වලින් 76-100% පරාසයේ එනම්, ලකුණු 15-20 අතර ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයදුම්කරුවන් 26%ක් පමණ වේ. මේ ආකාරයට එම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු වලින් 51-75% පරාසයේ එනම්, ලකුණු 10-15 අතර ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 23%කි. අයදුම්කරුවන්ගෙන් 22% ක් ලකුණු 5-10ත් අතර ලබා ගනිමින් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් 26-50% අතර පරාසයේ රැඳී සිටියි. අයදුම්කරුවන්ගෙන් 28%ක් ම ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් 25%ට අඩුවෙන්, එනම් ලකුණු 0-5ත් අතර රැඳී සිටියි.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)

### 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : 2 වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය i කොටස සඳහා 64% ක් පමණ ද, ii කොටස සඳහා 40% ක් පමණ ද, iii කොටස සඳහා 49% ක් පමණ ද වේ.

# II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

බුද්ධ ධර්මය I පත්‍රය බහුවරණ ප්‍රශ්න 40 කින් යුක්ත වේ. එක් ප්‍රශ්නයක් සඳහා වරණ හතරක් දී ඇත. ඉන් වඩාත් ම නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තෝරාගෙන තමන්ට ලැබෙන බහුවරණ පිළිතුරු පත්‍රයේ අදාළ අංකය සහිත කවය මත කතිර ලකුණ යෙදිය යුතු ය. එම බහුවරණ ප්‍රශ්න 40 ටම පිළිතුරු සැපයිය යුතුය. ඒ සඳහා කාලය පැය 01 කි. නමුත් විභාග ශාලාවේ දී පැය එකේ කාලය අවසන් වූ පසු ප්‍රශ්න පත්‍රය ආපසු නොගන්නා අතර, II පත්‍රයට ද පිළිතුරු සපයා අවසානයේ එම පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දිය යුතු යි.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. තමන් වහන්සේගේ රූපය දෙස ම බලමින් ඒ ගැන ම සිතමින් සිටි වක්කලී හිමියන් අමතා බුදුරදුන් දේශනා කෙළේ,
   (1) 'යමෙක් ගිලනුන්ට උපස්ථාන කරයි ද හෙතෙම මට උපස්ථාන කරයි' යනුවෙනි.
   (2) 'යමෙක් ධර්මය දකියි ද හෙතෙම මා දකියි' යනුවෙනි.
   (3) 'යමෙක් මෛත්‍රී වඩයි ද හෙතෙම සුගතියෙහි උපදී' යනුවෙනි.
   (4) 'යමෙක් අකුසල් සිදු කරයි ද හෙතෙම අපායෙහි උපදී' යනුවෙනි.

2. "ප්‍රඥ ලොවක් කරා තනිව, සන්නද්ධව, සරල දිවිමගක පිය නගන බැතිබර හා ප්‍රභාස්වර පෞරුෂයකින් පිරිපුන් තියම මිනිසකු බුදු සිරිතෙන් මම දකිමි."
   බුදුරජාණන් වහන්සේ පිළිබඳ මෙලෙස ප්‍රකාශ කෙළේ,
   (1) එච්. ජී. වේල්ස් ය. (2) සර් එඩ්වින් ආර්නෝල්ඩ් ය.
   (3) ජවහර්ලාල් නේරු ය. (4) අබ්දුල් අතාහිලා ය.

3. "බ්‍රාහ්මණය, දියෙන් උඩට පැමිණ දිය හා සම්බන්ධ නොවී පවත්නා පියුමක් මෙන් මම ද ලොවෙහි ඉපිද, ලොවෙහි හැදී වැඩී ලොව ඉක්මවා සිටිමි. එහෙයින් මා බුද්ධ යයි දැනගන්න."
   බුදුරජාණන් වහන්සේ මෙලෙස තමන් වහන්සේ හඳුන්වා දුන්නේ,
   (1) චංකී බමුණාට ය. (2) සෝණදණ්ඩ බමුණාට ය.
   (3) පොට්ඨපාද බමුණාට ය. (4) ද්‍රෝණ බමුණාට ය.

4. සිදුහත් බෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ දස පාරමිතා තුන් අයුරකින් බෙද දක්වා තිබේ. ඒවානම්
   (1) සීල, සමාධි, පඤ්ඤ වශයෙනි.
   (2) සාවක බෝධි, පච්චේක බෝධි, සම්මා සම්බෝධි වශයෙනි.
   (3) පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී වශයෙනි.
   (4) දන, සීල, භාවනා වශයෙනි.

5. පාරමී ධර්ම පූරණ ආකාරය අනුව, තම ජීවිතය ද කැප කරමින් පෙරුම්දම් පිරීම හඳුන්වනු ලබන්නේ,
   (1) පාරමී වශයෙනි. (2) උප පාරමී වශයෙනි.
   (3) පරමත්ථ පාරමී වශයෙනි. (4) වීමංසා පාරමී වශයෙනි.

6. අප බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය පැහැදිලි වන ජාතක කතාවකි.
   (1) වණ්ණුපථ ජාතකය (2) මඛාදේව ජාතකය
   (3) තේමිය ජාතකය (4) උම්මග්ග ජාතකය

7. බුදුරජාණන් වහන්සේ "මහණෙනි, බොහෝ දෙනාට හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න." යනුවෙන් දේශනා කෙළේ,
   (1) පස්වග මහණුන්ට ය. (2) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය.
   (3) උරුවෙල් කාශ්‍යප ඇතුළු පිරිසට ය. (4) මුල් ම රහතන් වහන්සේලා හැට නමට ය.

8. සෝවාන් ඵලයට පත්ව සිටි පස්වග මහණුන් අර්හත්වයට පත්වීමට ශ්‍රවණය කෙළේ,
   (1) අනත්ත ලක්ඛණ සූත්‍රයයි. (2) ධම්මචක්ඛ පවත්තන සූත්‍රයයි.
   (3) ආදිත්ත පරියාය සූත්‍රයයි. (4) වේදනා පරිග්ගහ සූත්‍රයයි.

9. බිම්බිසාර රජතුමා බුදුරදුන්ට පූජා කළ ආරාමය,
   (1) ජේතවනාරාමයයි. (2) වේළුවනාරාමයයි.
   (3) පූර්වාරාමයයි. (4) න්‍යග්‍රෝධාරාමයයි.

10. තමා අවබෝධ කළ ධර්මය කෙලෙස් හරිත සාමාන්‍ය ජනතාවට අවබෝධ කරවීමේ අපහසුතාව පිළිබඳ සිතමින් සිටි බුදුරජාණන් වහන්සේට ධර්මය දේශනා කිරීමට ආරාධනා කෙළේ,
    (1) සහම්පතී බ්‍රහ්මයා ය. (2) උද්දකරාමපුත්‍ර තවුසා ය.
    (3) සංජය පිරිවැජියා ය. (4) සොත්තිය බමුණා ය.

11. සම්බුද්ධ ශාසනයේ ද්වේවාචික උපාසකවරුන් ලෙස සැලකෙන්නේ,
    (1) අසිත, සර්වමිත්‍ර තවුසන් ය. (2) ආලාර කාලාම, භාර්ගව තවුසන් ය.
    (3) තපස්සු, භල්ලුක වෙළෙඳුන් ය. (4) පස්වග තවුසන් ය.

12. සිසු පිරිස සමහ විහාරස්ථානය වෙත පැමිණි ගුරුතුමිය, සිසුන්ට ත්‍රිවිධ චෛත්‍ය හඳුන්වා දුන්නා ය. ගුරුතුමිය නිවැරදි ව හඳුන්වා දුන් පරිදි බුදුරජාණන් වහන්සේ පිට දුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ හඳුන්වන්නේ,
    (1) ශාරීරික චෛත්‍යය ලෙස ය. (2) පාරිභෝගික චෛත්‍යය ලෙස ය.
    (3) උද්දේසික චෛත්‍යය ලෙස ය. (4) සධාතුක චෛත්‍යය ලෙස ය.

13. "පරලෝ සුවපතා දෙන දනය පිළිගැනීමට සුදුසු ය" යන සංඝරත්නයේ ගුණය ප්‍රකාශ වන්නේ,
   (1) "දක්ඛිණෙය්‍යය" යන්නෙනි. (2) "අඤ්ජලිකරණීය" යන්නෙනි.
   (3) "ආහුණෙය්‍යය" යන්නෙනි. (4) "පාහුණෙය්‍යය" යන්නෙනි.

14. තරුණ යුවළ තම දූ දරුවන් සමඟ දිනපතා මල් පහන් පූජා කොට බුදුන් වැඳීම සිරිතක් කොට ගත්හ. ඔවුන් මෙසේ කිරීමට යොමු වූයේ පාසලේ දී බුද්ධ ධර්මය විෂයයෙහි උගත්,
   (1) සැදැහැති බෞද්ධයන්ගේ ලක්ෂණ හඳුනාගෙන තිබූ නිසා ය.
   (2) නිවන් දකීමට එක ම මග එය නිසා ය.
   (3) අන්ධානුකරණයේ ලක්ෂණ හඳුනාගෙන තිබූ නිසා ය.
   (4) විශ්වාසයෙන් අදහන්නකුගේ ලක්ෂණ හඳුනාගෙන තිබූ නිසා ය.

15. අන්‍යොන්‍ය වශයෙන් සමාජ සම්බන්ධතා ගොඩනංවමින් ඔවුනොවුනට යුතුකම් ඉටුකරමින් සදාචාර සම්පන්න ජීවිතයක් ගෙනයාමට උපදෙස් සපයන සූත්‍රදේශනාව වන්නේ,
   (1) මංගල සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
   (3) ධම්මික සූත්‍රයයි. (4) සිගාලෝවාද සූත්‍රයයි.

16. "ගිලනුන්ට උපස්ථාන කරන්නා බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරයි" යන ආදර්ශ පාඨය අනුව චිත්‍රයකට නැගීමට සුදුසු ම අවස්ථාව වන්නේ,
   (1) චූල්ලතිස්ස හිමියන්ට උපස්ථාන කරන අවස්ථාවයි.
   (2) මණිකාර කුළුපගතිස්ස හිමියන්ට උපකාර කරන අවස්ථාවයි.
   (3) පූතිගත්තතිස්ස හිමියන්ට උපකාර කරන අවස්ථාවයි.
   (4) ලකුණ්ටක භද්දිය හිමියන්ට උපකාර කරන අවස්ථාවයි.

17. මෙත් වැඩීම ආරම්භ කරන පුද්ගලයා ඇති කර ගත යුතුයැ'යි කරණීය මෙත්ත සූත්‍රයේ දී දේශනා කළ ගුණාංග අතර, ලද දෙයින් සතුටුවීම,
   (1) අනතිමානී නමින් හැඳින් වේ. (2) සන්තුස්සකො නමින් හැඳින් වේ.
   (3) අප්පකිච්චො නමින් හැඳින් වේ. (4) සන්තින්ද්‍රියො නමින් හැඳින් වේ.

18. "ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති" මංගල සූත්‍රයේ සඳහන් මෙම පාඨයෙන් විස්තර කෙරෙන්නේ,
   (1) සුදුසු පෙදෙසක විසිය යුතු බවයි.
   (2) බාලයන් ඇසුරු නොකළ යුතු බවයි.
   (3) අටලෝ දහමෙහි කම්පා නොවී සිටිය යුතු බවයි.
   (4) මව්පියන්ට උපස්ථාන කළ යුතු බවයි.

19. ආශ්‍රය කිරීමට සුදුසු මිතුරකු නොලබන්නේ නම් හුදෙකලාව විසීම සුදුසු බව අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
   (1) "චරං චෙ නාධි ගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිස මත්තනො" යන්නයි.
   (2) "අසාරෙ සාරමතිනො - සාරෙ චාසාර දස්සිනො" යන්නයි.
   (3) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ" යන්නයි.
   (4) "උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්ම කාරිනො" යන්නයි.

20. නීවරණ ධර්ම අතරට ගැනෙන සිතේ උදාසීන ගතිය, චෛතසිකයන්ගේ අලස ගතිය,
   (1) ව්‍යාපාද නමින් හැඳින් වේ. (2) ථීනමිද්ධය නමින් හැඳින් වේ.
   (3) උද්ධච්ච කුක්කුච්ච නමින් හැඳින් වේ. (4) විචිකිච්චා නමින් හැඳින් වේ.

21. සත්ත්වයා යනු ස්කන්ධ පහක එකතුවක් ලෙස බුදු දහම පැහැදිලි කරයි. එම ස්කන්ධ **පහ**,
   (1) පඨවි, ආපො, තේජො, වායො, ආකාස නම් වේ.
   (2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නම් වේ.
   (3) චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය නම් වේ.
   (4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ නම් වේ.

22. මෛත්‍රී වැඩීමෙහි ආනිශංස ගණයට ඇතුළත් **නො වන** කරුණ වන්නේ,
   (1) නපුරු සිහින නොදකීම යන්නයි. (2) සිහිමුලා නොවී කලුරිය කිරීම යන්නයි.
   (3) සිත වහා සමාධි ගත නොවීම යන්නයි. (4) ගින්නෙන්, විසෙන් හා ආයුධවලින් හානි නොවීම යන්නයි.

23. කාමයෙන්, හිංසනයෙන් හා දැඩි ක්‍රෝධයෙන් බැහැරවීම, අරි අටඟි මගෙහි හැඳින්වෙන්නේ,
   (1) සම්මා දිට්ඨි නමිනි. (2) සම්මා සංකප්ප නමිනි.
   (3) සම්මා වායාම නමිනි. (4) සම්මා සති නමිනි.

24. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" මෙම විවරණය අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීම සඳහා,
(1) චේතනාව අත්‍යවශ්‍ය වේ. (2) දෘෂ්ටිය අත්‍යවශ්‍ය වේ.
(3) කුසලය අත්‍යවශ්‍ය වේ. (4) අකුසලය අත්‍යවශ්‍ය වේ.

25. ගවයා පසුපස යන රිය සක මෙන් පුද්ගලයාට දුක ගෙන දෙමින් ඔහු පසුපස දුක ගමන් කරන්නේ ඔහු සිදුකළ,
(1) කුසල කර්ම විපාක නිසා ය. (2) අකුසල කර්ම විපාක නිසා ය.
(3) අචේතනික කර්ම විපාක නිසා ය. (4) අහේතුක කර්ම විපාක නිසා ය.

26. "අඹ ඇටයක් පැළ කළ විට අඹ පැළයක් ම ලැබෙනුයේ කිසිවකුගේ මැදිහත්වීමකින් නොව හේතු ප්‍රත්‍ය අනුරූපව ය." ධර්මයේ මෙය හඳුන්වන්නේ
(1) උතු නියාම යනුවෙනි. (2) බීජ නියාම යනුවෙනි.
(3) ධම්ම නියාම යනුවෙනි. (4) චිත්ත නියාම යනුවෙනි.

27. මෙම ජීවිතයේ ම විපාක ලැබෙන කර්ම,
(1) දිට්ඨධම්මවේදනීය කර්ම නමින් හැඳින් වේ. (2) උපපජ්ජවේදනීය කර්ම නමින් හැඳින් වේ.
(3) අපරාපරියවේදනීය කර්ම නමින් හැඳින් වේ. (4) අහෝසි කර්ම නමින් හැඳින් වේ.

28. පුද්ගලයාට කිසියම් භවයක උපත ලබා දීමට ඉදිරිපත් වන කුසලාකුසල කර්ම,
(1) උප ඝාතක කර්ම නම් වේ. (2) උප පීළක කර්ම නම් වේ.
(3) උපස්තම්භක කර්ම නම් වේ. (4) ජනක කර්ම නම් වේ.

29. "හෙතුං පටිච්ච සම්භූතං - හෙතුභංගා නිරුජ්ඣති" මෙලෙස උගන්වන ධර්ම පරියාය හැඳින්වෙන්නේ,
(1) කර්මවාදය නමිනි. (2) අහේතුක අප්පච්චයතාවාදය නමිනි.
(3) පුනර්භවවාදය නමිනි. (4) පටිච්චසමුප්පාදය නමිනි.

30. පළමුවැනි ධර්ම සංගායනාවේ දී ධර්ම විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට භික්ෂූන්ට පවරනු ලැබූ අවස්ථාවේ සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට පවරනු ලැබුයේ,
(1) දීඝ නිකායයි. (2) මජ්ඣිම නිකායයි.
(3) සංයුක්ත නිකායයි. (4) අංගුත්තර නිකායයි.

31. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නො වන** කරුණ වන්නේ,
(1) දුසිල් මහණුන් සසුනෙන් නෙරපීම යන්නයි. (2) නවරට සසුන් පිහිටුවීම යන්නයි.
(3) දසවස්තු ප්‍රතික්ෂේප වීම යන්නයි. (4) කථාවත්ථුප්පකරණය සම්පාදනය යන්නයි.

32. වංශ කථාවල සඳහන් වන පරිදි අනුරාධපුර යුගයේ බෞද්ධ රජවරුන් සිදු කළ ගිරිභාණ්ඩ පූජා මහෝත්සවය යන්නෙන් අදහස් වන්නේ,
(1) විවිධ පූජාවස්තු ගොඩගසා ඒවා භික්ෂූන්ට පූජා කිරීමයි.
(2) ගිරි නිගණ්ඨයා වෙනුවෙන් සිදු කළ උත්සවයයි.
(3) තුන්බිය දුරලීම සඳහා පිරිත් දේශනා කිරීමයි.
(4) කඳු මත පූජා පැවැත්වීමයි.

33. සම්බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 236 කට පසුව ධර්ම සංගායනාවක් පැවැත්වූයේ,
(1) කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ දී ය. (2) රජගහනුවර සප්තපර්ණී ගුහාවේ දී ය.
(3) විශාලාමහනුවර වාලුකාරාමයේ දී ය. (4) පැළලුප්නුවර අශෝකාරාමයේ දී ය.

34. ස්තූපයක ආරක්ෂාවට ස්තූපය වට කොට තනා ඇති ගොඩනැගිල්ල,
(1) පධානඝර නමින් හැඳින් වේ. (2) චේතියඝර නමින් හැඳින් වේ.
(3) පටිමාඝර නමින් හැඳින් වේ. (4) වාහල්කඩ නමින් හැඳින් වේ.

35. දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා පාලකයකු අනුගමනය කළ යුතු ශ්‍රේෂ්ඨ ගුණධර්ම අතර, දස රාජධර්මවලට අයත් වන, ක්ෂණික තීරණ නො ගනිමින්, බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීම,
(1) අක්‍රොධය නම් වේ. (2) අවිහිංසාව නම් වේ.
(3) ඉවසීම නම් වේ. (4) අවිරෝධය නම් වේ.

36. වජ්ජී සමූහාණ්ඩුවේ පාලකයින් අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්මවලට අයත් **නො වන** කරුණ වන්නේ,
(1) නිතර නිතර රැස්වීම යන්නයි.
(2) සමගියෙන් රැස්ව සමගියෙන් විසිරයාම යන්නයි.
(3) වැඩිහිටියන්ට ගරු කිරීම යන්නයි.
(4) නොපැනවූ නීති පැනවීම හා පැනවූ නීති කඩ නො කිරීම යන්නයි.

37. වලගම්බා රජ දවස මාතලේ අලුවිහාරයේ දී සිදුකළ වැදගත් ම මෙහෙය වූයේ,

(1) එතෙක් පැවැති නියඟය දුරු කර දඩි වැසි ලබාදීමයි.
(2) මතකයෙන් ගෙනා ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමයි.
(3) භික්ෂු පිරිස ථෙරවාද මහායාන ලෙස බෙදී යාමයි.
(4) ත්‍රිපිටකය අසල්වැසි රටවලට ගෙනයාමයි.

38. ශ්‍රී ලාංකික ශාසන ඉතිහාසයේ භික්ෂු සංඝයාට පොදුවේ ආරාම පූජා කරනු ලැබුව ද පළමුවැනිවරට පෞද්ගලික ආරාම පූජාවක් කරනු ලැබුවේ,

(1) දුටුගැමුණු රජතුමා විසිනි.
(2) කාවන්තිස්ස රජතුමා විසිනි.
(3) වලගම්බා රජතුමා විසිනි.
(4) මහසෙන් රජතුමා විසිනි.

39. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි පාලන සමයේ සිංහල බෞද්ධ දරුවන් සඳහා පාසල් නොතිබුණු බැවින් පරම විඥනාර්ථ බෞද්ධ සමාගම පිහිටුවා ඒ මගින් බෞද්ධ පාසල් ආරම්භ කිරීමට පියවර ගනු ලැබුවේ,

(1) සර් හෙන්රි ඕල්කොට්තුමන් විසිනි.
(2) අනගාරික ධර්මපාලතුමන් විසිනි.
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි.
(4) ගුණපාල මලලසේකර මහතාණන් විසිනි.

40. තිදෙරින් සිදු වන අකුසල ක්‍රියා ගණයට අයත් **නො වන** කරුණ වන්නේ,

(1) අභිධ්‍යා යන්නයි.
(2) ව්‍යාපාදය යන්නයි.
(3) මිථ්‍යා දෘෂ්ටිය යන්නයි.
(4) සක්කාය දිට්ඨි යන්නයි.

### 2.1.3. අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 4 |
| 02. | 1 | 22. | 3 |
| 03. | 4 | 23. | 2 |
| 04. | 3 | 24. | 1 |
| 05. | 3 | 25. | 2 |
| 06. | 2 | 26. | 2 |
| 07. | 4 | 27. | 1 |
| 08. | 1 | 28. | 4 |
| 09. | 2 | 29. | 4 |
| 10. | 1 | 30. | 2 |
| 11. | 3 | 31. | 3 |
| 12. | 2 | 32. | 1 |
| 13. | 1 | 33. | 4 |
| 14. | 1 | 34. | 2 |
| 15. | 4 | 35. | 3 |
| 16. | 3 | 36. | 4 |
| 17. | 2 | 37. | 2 |
| 18. | 3 | 38. | 3 |
| 19. | 1 | 39. | 1 |
| 20. | 2 | 40. | 4 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.**

### 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

- ⋆ I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 (පිටුව 8) ඇසුරෙන් සකස් කර ඇත.

- ⋆ I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්න අංක 4, 25, 26, 27 සහ 37 සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 84%ට වඩා වැඩිය. එම ප්‍රශ්නවලට සිසුන් පහසුවෙන් පිළිතුරු සපයා ඇත.

- ⋆ ප්‍රශ්න අංක 13 සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 29%කි. අයදුම්කරුවන් 71%කටම නිවැරදි පිළිතුර සැපයීමට නොහැකි වී ඇත. නමුත් මෙම ප්‍රශ්නය සඟ ගුණ පිළිබඳව ප්‍රශ්න පත්‍රයේ ඇති ඉතාම පහසු ප්‍රශ්නයක් වන අතර, පිළිතුර ද පහසුවෙන් තෝරා ගැනීමට අවකාශ ලබා දී ඇත. ඒ සඳහා සිසුන්ගේ අවබෝධය හා අවධානය නිසි පරිදි යොමු වී නැත. නිවැරදිව කියවා නිවැරදිව පිළිතුර සැපයීමට අඩු අවධානයක් යොමු වී ඇත්තේ සඟ ගුණ පිළිවෙලින් තේරුම සමඟ මතක තබා නොගැනීම නිසාය. මේ නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙවැනි විෂය කරුණු පිළිබඳව සිසුන්ගේ වැඩි අවධානයක් යොමුවන පරිදි ඉගැන්වීමට වග බලා ගත යුතුය.

- ⋆ ප්‍රශ්න අංක 2, 10, 23, 30, 39 සහ 40 සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රමාණය 50%ටත් වඩා අඩු බව පෙනේ. ප්‍රශ්න අංක 2 සඳහා පිළිතුර පහසුවෙන් තෝරා ගැනීමට නොහැකි වී ඇත්තේ 11 ශ්‍රේණියේ පෙළපොතේ විෂය මාතෘකා හැඳෑරීමේ දී සිසුන්ගේ අවබෝධය පහළ මට්ටමක පැවතීමයි. ඉහත සඳහන් අනෙකුත් ප්‍රශ්න සඳහා ද පැහැදිලි පිළිතුරු තෝරා ගැනීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇත්තේ 10 හා 11 ශ්‍රේණිවල පෙළපොත් නිසි ආකාරව අවධානයෙන් පරිශීලනය කර නොමැති බැවිනි.

- ⋆ ප්‍රශ්න අංක 3, 6, 12, 19, 31, 34 සහ 36 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 55%කට වැඩි පිරිසක් සාර්ථකව පිළිතුරු දී ඇත. ප්‍රශ්න අංක 31, 34 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් පිළිවෙලින් 52%ක් හා 55%ක් පමණ නිවැරදි පිළිතුරු සපයා ඇත. නමුත් අයදුම්කරුවන්ගෙන් 45%කට පමණ ශාසන ඉතිහාසය පිළිබඳ දැනුම සහ අවබෝධය අඩු බව පෙනේ. මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය පිළිබඳ නිපුණතා සිසුන් තුළ සංවර්ධනය කළ යුතුය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් යුක්ත ය. පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එය කෙටි ප්‍රශ්න දහයකින් යුක්ත වන අතර ඒ සඳහා ලකුණු 20ක් ලැබේ. අනෙක් ප්‍රශ්න ව්‍යුහගත ප්‍රශ්න වන අතර ව්‍යුහගත ප්‍රශ්න හයෙන් හතරකට පිළිතුරු සැපයිය යුතු ය. ඒ සඳහා එක් පිළිතුරකට ලකුණු දහය බැගින් ලැබේ. මේ අනුව II ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4 ඇසුරින් සකස් කර ඇත.

### (ව්‍යුහගත රචනා)

1 ප්‍රශ්නය

**1.** (i) **ජේතවනාරාමය සහ පූර්වාරාමය යන ආරාම ඉදිකොට, බුදුරජාණන් වහන්සේට පූජා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?**

(ii) **බුදුරජාණන් වහන්සේ, දවස කොටස් පහකට බෙදා, ඉතා ම අර්ථවත්ව කළමනාකරණය කරමින් කාලසටහනකට අනුව කාලය ගත කළහ. එයින් දිවා කාලය කොටස් දෙකකට බෙද ගත කළහ. එම කොටස් දෙක නම් කරන්න.**

(iii) **සමාජයේ සෙසු පුද්ගලයන් සතුන් මැරීම ආදී අකුසල ක්‍රියාවලින් අපිරිසිදුව සිටිය දී එම දුසිරිත් දක දකත් ඒවාට ගොදුරු නොවී පිරිසිදු සිතින් වාසය කිරීමේ ප්‍රතිපදාව හැඳින්වෙන නම කුමක් ද?**

(iv) **බුද්ධ සාසනයේ දක්වෙන සිවුවනක් පිරිස නම් කරන්න.**

(v) **මානසික අසහනයක් හෝ ගැටලුවක් හෝ ඇති වූ විට කම්පාවට පත් නොවී දිරිමත්ව ජීවිතය පවත්වා ගැනීමට උපදෙස් සපයන බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය ලෙස සැලකෙන ධර්ම ග්‍රන්ථය කුමක් ද?**

(vi) **"කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො" මෙම පාඨයෙන් බුදුරදුන් සමාජයට දුන් පණිවුඩය කුමක් ද?**

(vii) **මෙම ලෝකය බොහෝ කාලයක ඇවෑමෙන් හැකිළෙන බවත්, තවත් බොහෝ කාලයක ඇවෑමෙන් නැවත දිගහැරෙන බවත් පෙන්වා දෙමින් බුදුරජාණන් වහන්සේ හේතුඵල සම්බන්ධතාව මත විශ්වයේ පරිණාමය පැහැදිලි කළහ. මෙම කරුණු විස්තර වන සූත්‍ර දේශනාව කුමක් ද?**

(viii) **"යො ධම්මං පස්සති - සො පටිච්චසමුප්පාදං පස්සති." යන මෙම පාඨයෙන් ප්‍රකට කෙරෙන ධර්ම කරුණ කුමක් ද?**

(ix) **සිසුන් සමඟ වාර්ෂික චාරිකාවට එක් වූ ගුරුතුමිය අනුරාධපුරයේ ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය යන ස්තූප නරඹා අවසන් වූ පසු එම ස්තූප ගොඩනැංවූ රජවරුන් සිවුදෙනා කවුරුන්දැයි විමසී ය. සිසුන් ලබා දිය යුතු නිවැරදි පිළිතුර ලියන්න.**

(x) **භික්ෂු ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය මූලික කරුණු හතරක් සිව්පසය නමින් බුදු දහමෙහි පෙන්වා දී ඇත. එම කරුණු මොනවා ද?**

(1) **අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) අනේපිඬු සිටුතුමා, විශාඛා මහා උපාසිකාව
(ii) පෙර බත් කිස, පසු බත් කිස
(iii) සල්ලේඛ ප්‍රතිපදාව
(iv) භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා
(v) ධම්මපදය
(vi) පුද්ගලයා උසස් පහත් බවට පත්වන්නේ ඔහුගේ ක්‍රියාවන් අනුව ය.
පුද්ගලයා කරන ක්‍රියාවට අනුව වසලයකු හෝ බ්‍රාහ්මණයකු වන බවයි.
(vii) අග්ගඤ්ඤ සූත්‍රය.
(viii) බෞද්ධ හේතුඵලවාදය / පටිච්ච සමුප්පාදය

| | | | |
|---|---|---|---|
| (ix) | ථූපාරාමය | - | දෙවන පෑතිස් රජතුමා |
| | රුවන්වැලිසෑය | - | දුටුගැමුණු රජතුමා |
| | අභයගිරිය | - | වළගම්බා රජතුමා |
| | ජේතවනය | - | මහසෙන් රජතුමා |
| (x) | චීවර | - | සිවුරු පිරිකර |
| | පිණ්ඩපාත | - | දානය/ ආහාරපාන |

සේනාසන - සෙනසුන්/ ඉඳුම් හිටුම්
ගිලානපච්චය - ගිලන්පස /බෙහෙත් හේත්

*(එක් නිවැරදි පිළිතුරකට ලකුණු දෙක (02) බැගින් ලකුණු (10 × 2) 20 යි.)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

- 1 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එයට ලකුණු 20ක් හිමි ය. එම ප්‍රශ්නයට අපේක්ෂක, අපේක්ෂිකාවන්ගෙන් 98%ක පමණ ප්‍රතිශතයක් පිළිතුරු සපයා ඇති බව ප්‍රස්තාර අංක 2න් පැහැදිලි වේ. 2%ක් පමණ අයදුම්කරුවන් ප්‍රශ්නය අනිවාර්ය වුවද පිළිතුරු සපයා නැත. 29%ක් පමණ සිසුන් ලබා ඇති ලකුණු පරාසය 0-5 අතර වේ. ප්‍රතිශතයක් ලෙස ගතහොත් මෙම සිසුන් 0%-25%ත් අතර ලකුණු ලබා ඇත. එසේම ලකුණු 16-20 අතර ලකුණු ලබා ඇති ප්‍රමාණය 26%කි. එම සිසුන් ප්‍රමාණය 76%-100%ත් අතර ලකුණු ලබා ගෙන ඇත.

- ප්‍රස්තාර අංක 4ට අනුව ප්‍රශ්නයේ (iv) සහ (v) යන කොටස් සඳහා 70%ට අධික සිසුන් පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. නමුත් ප්‍රශ්නයේ (iii) හා (vii) යන කොටස් සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 34%කට ආසන්න සිසුන් ප්‍රමාණයකි. එසේ ලකුණු අඩු වීමට හේතුවී ඇත්තේ ප්‍රශ්නයට අනුකූලව සිසුන් වැඩි පිරිසක් පස්පව් සහ දස අකුසල් පිළිබඳ වැරදි අවබෝධයකින් පිළිතුරු සපයා තිබීම ය.

- (vii) කොටසට 34%ක ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා ඇත. 66%ක පමණ ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයේදී අසාර්ථක වී ඇත්තේ විෂය නිර්දේශයට අනුකූලව 10-11 ශ්‍රේණිවල පෙළපොත් නිසි අයුරින් අධ්‍යයනය නොකිරීම නිසාය.

- තවද විෂය දැනුම ලබාගැනීම සඳහා අතිරේක ධර්ම ග්‍රන්ථ මෙන්ම ඉතිහාස ග්‍රන්ථ පරිශීලනයෙහි යෙදීමට සිසුන්ට ඉඩ ප්‍රස්ථා ලබා දිය යුතුය. ධර්ම කරුණු පිළිබඳව සියලුම දෙනාට නිවැරදි නිශ්චිත දැනුමක් ලබා දීම මගින් සිසුන්ගේ දුර්වලතා මගහරවා ගත හැකිය.

## 2 ප්‍රශ්නය

**2.** සිල් සමාදන් වූ සිසු පිරිසකට භාවනා වැඩසටහන ආරම්භ කරමින් ගරුතර ස්වාමීන් වහන්සේ මෙලෙස පැහැදිලි කිරීමක් කළ හ.

"පින්වත් දරු දරියනි, අප අද පුහුණු කරන්නේ මෛත්‍රී භාවනාවයි. මේ පිළිබඳ කරුණු පැහැදිලි වන, වනයේ භාවනානුයෝගීව සිටි භික්ෂු පිරිසකට සිදු වූ ගැහැටක් මහ හරවාගෙන, අමනුෂ්‍යයින්ගේ සිත් මෛත්‍රියෙන් දිනාගැනීමට බුදුරදුන් දේශනා කළ වැදගත් සූත්‍ර දේශනාවක් තියෙනව. මෙම සූත්‍රයේ මුලින් ම විස්තර කෙරෙන්නේ මෛත්‍රී වඩන පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග හෙවත් චරිත ලක්ෂණයි. ඊළඟට මෛත්‍රී වැඩිය යුතු සත්ත්ව කොට්ඨාශ දක්වනව. ඉන්පසු මෛත්‍රී වැඩිය යුතු අයුරු පැහැදිලි කරනව."

(i) මෙහි දක්වෙන, මෛත්‍රී වැඩීමට අදළ කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද?

(ii) එම සූත්‍රයේ සඳහන් වන පරිදි මෛත්‍රී වඩන පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) සාමකාමී සමාජයක් ගොඩනැගීමට මෛත්‍රී සහගත පැවැත්ම ඉවහල් වන අයුරු පහදන්න.

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i) කරණීයමෙත්ත සූත්‍රය *(ලකුණු 02 යි)*

(ii)

| | | |
|---|---|---|
| සක්කෝ | - | කිසියම් ක්‍රියාවක් කිරීමේ ශක්තියෙන් යුක්ත වීම |
| උජු | - | අවංකවීම |
| සූජු | - | අතිශයින් අවංකවීම |
| සුවචෝ | - | පහසුවෙන් යමක් කියා ඒත්තු ගැන්විය හැකිවීම |
| මුදු | - | මෘදු හැසිරීම |
| අනතිමානි | - | ආඩම්බරයෙන් තොරවීම |
| සන්තුස්සකෝ | - | ලද දෙයින් සතුටුවීම |
| සුභරෝ | - | පහසුවෙන් පෝෂණය කළ හැකිවීම |
| අප්පකිච්චෝ | - | කටයුතු බහුල නොවීම |
| සල්ලහුක වුත්ති | - | සරල ගති පැවතුම් ඇති බව |
| සන්තින්ද්‍රියෝ | - | සන්සුන් ඉඳුරන් ඇති බව |
| නිපකෝ | - | නුවණැති වීම |
| අප්පගබ්භෝ | - | ගොරෝසු හැසිරීමෙන් තොරවීම |
| කුලෙසු අනනුගිද්ධෝ | - | පවුල් කෙරෙහි නොඇලීම |
| නච ඛුද්දං සමාචරෙ කිඤ්චි යේන විඤ්ඤූපරේ උපවදෙය්‍යුං | - | නුවණැත්තන්ගෙන් දොස් ඇසීමට හේතු වන කිසිදු වරදක් නොකරන බව |

*(මින් ඕනෑම කරුණු තුනක් සඳහන් පිළිතුරට ලකුණු 03 යි.)*

(iii) මෛත්‍රී සහගත පැවැත්ම සාමකාමී සමාජයක් ගොඩනැගීමට ඉවහල් වේ. එය පුද්ගලයාගේ පෞද්ගලික මානසික සහනය සඳහා මෙන්ම සමාජ සුහදත්වය සඳහා ද ඉවහල් වේ. මෛත්‍රිය යනු හුදෙක් "සියලු සත්වයෝ සුවපත් වෙත්වා" යයි කීම පමණක් ම නොවේ. අවමන් නොකිරීම, ද්වේෂ නොකිරීම, කිසිම සත්වයකු සමග නොගැටීම ද ඊට අයත්වේ. නියම මෛත්‍රිය කායික වාචසික හා මානසික චර්යාවකි. එය සමස්ත විශ්වයේ සතුරු මිතුරු සියලු සත්වයන් වෙත දෛනික ජීවිතයේ සෑම අවස්ථාවකදී ම වැඩිය යුතු පැතිරවිය යුතු උතුම් සිතුවිල්ලකි. ඒ තුළින් සාමකාමී සමාජයක් ගොඩ නැගේ.

යුද ගැටුම්, කලහකාරී තත්ත්වයන්, කලකෝලාහලවලින් තොර සන්සුන් සාමකාමී සමාජයක් සඳහා ද, සමාජ සහජීවනය සඳහා ද මෛත්‍රී සහගත පැවැත්ම අත්‍යවශ්‍ය වේ.

*(පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.)*
*(ලකුණු 05 යි.)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය ප්‍රස්තාර අංක 2 අනුව අපේක්ෂකයින්ගෙන් 80%ක් පමණ තෝරාගෙන තිබුණි. එයට නියමිත මුළු ලකුණු සංඛ්‍යාව 10කි. ඉන් 36%ක් පමණ සිසුන් ලබා ඇති ලකුණුවල පරාසය 0-2 අතර වේ. 3 වන ප්‍රස්තාරයට අනුව 8-10 පරාසය අතර ලකුණු ලබා ඇත්තේ 24%ක් පමණ අයදුම්කරුවන් සංඛ්‍යාවකි. ප්‍රස්තාර අංක 4 අනුව (i) කොටසට 64%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇති නමුත්, (ii) කොටසට පිළිතුරු සපයා ඇත්තේ 40%ට ආසන්න ප්‍රමාණයකි. (iii) කොටසට 49%ක් පමණ සාර්ථකව පිළිතුරු දී ඇත. අදාළ සූත්‍ර දේශනාව කුමක්දැයි නම් කළ සිසුන් එහි අන්තර්ගතය කෙටියෙන් විස්තර කිරීමට අපොහොසත් වී ඇති බව පෙනේ. එයට හේතුව අවබෝධයෙන් ඉගෙන නොගැනීමයි.

හොඳ අවබෝධයකින් විෂය දැනුම ලබා ගැනීම සඳහා පෙළ පොත්වලට අමතරව පෙළ පොතේ සඳහන් කර ඇති ධර්ම ග්‍රන්ථ පරිශීලනයට සිසුන් යොමු කළ යුතුය. එම ධර්ම ග්‍රන්ථවල අඩංගු කරුණු පිළිබඳව සියලු දෙනාම නිවැරදි නිශ්චිත දැනුමක් ලබා තිබීම ඉතා වැදගත් වේ.

## 3 ප්‍රශ්නය

**3.** **"ස්වාමීනි, මේ ගමට එන සමහර මහණ බමුණෝ අනුන්ගේ ඉගැන්වීම්වලට පරිභව කරමින් තම ඉගැන්වීම් උසස් කොට දක්වති. තවත් සමහර මහණ බමුණෝ තම ඉගැන්වීම් පමණක් උසස් කොට දක්වමින් අන් මහණ බමුණන්ගේ ඉගැන්වීම් පහත් කොට දක්වති. ස්වාමීනි මෙම මහණ බමුණන් අතුරෙන් කවරෙක් සත්‍යය කියත් ද, කවරෙක් අසත්‍යය කියත්ද'යි අපට සැකයක්, විමතියක් ඇතිව තිබේ."**

(i) **බුදුරජාණන් වහන්සේට ඉහත ආකාරයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබුවේ කවුරුන් විසින් ද?**

(ii) **ඉහත අවස්ථාවට සම්බන්ධ කරුණු ඇතුළත් සූත්‍ර දේශනාවේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ කුසල් මුල් තුන නම් කර, ඒවා පුද්ගල යහපත පිණිස පවතින අයුරු පහදන්න.**

(iii) **සිතීමට හා විමසීමට බුදු දහමින් කර ඇති මග පෙන්වීම කෙටියෙන් විස්තර කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) කේසපුත්ත නම් ගමෙහි කාලාමයෝ / කාලාම වැසියෝ *(ලකුණු 02 යි)*

(ii) අලෝභ - (ලෝභයෙන් තොර පරිත්‍යාගශීලි ස්වභාවය)
අදෝස - (ද්වේෂයෙන් තොර මෛත්‍රී ස්වභාවය)
අමෝහ - (ප්‍රඥාව හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැන ගැනීමට ඇති හැකියාව)

යනු කුසල් මුල් තුනයි. මේ කුසල් මුල් කෙනෙකු තුළ ඇති වීමෙන් කෙරෙන ක්‍රියා කුසල ක්‍රියාවන්ය. ඒවා යහපත්ය. තමාගේ හා අන් අයගේ යහපත පිණිස හේතුවේ. එබැවින් එවැනි ක්‍රියා සැමටම හිතකර ය. නුවණැත්තන්ගේ ප්‍රශංසාවට හේතුවන, යහපත හා සැප පිණිස හේතුවන කුසල ක්‍රියාවන්ට මේ කුසල මූලයන් හේතු කාරක වන බැවින් පුද්ගල යහපත පිණිස පවතින බව ප්‍රකාශ කළ හැකිය.

*(කුසල් මුල් තුන නම් කිරීමට ලකුණු 01 ක් ද පුද්ගල යහපත පිණිස පවතින අයුරු පැහැදිලි කිරීමට ලකුණු 02 ක් ද ලබා දෙන්න.)*

*(මුළු ලකුණු 03 යි)*

(iii) සිතීමටත්, විමසීමටත්, සැක කිරීමට හා ප්‍රශ්න කිරීමටත්, බුදු දහමෙන් අපට අනුබලය ලැබේ. තම තීරණ පිළිබඳව වගකීම පැවරී ඇත්තේ තමාටම ය. සැක කිරීමට හා ප්‍රශ්න කිරීමට ඇති හැකියාව යහපත් අතට යොදා ගන්නා ආකාරය කාලාම සූත්‍රයෙන් පැහැදිලි කරයි. කිසිවක් එක එල්ලේ පිළි ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නොකොට, මෙම කරුණු කුසලය,

මෙම කරුණු අකුසලය, වරද සහිතය, වරද රහිතය යනුවෙන් තමාම වටහා ගැනීමට නිදහස් චින්තනයෙන් අපට මග පෙන්වා දෙයි.

*(පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.)*

*(ලකුණු 05 යි)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

ප්‍රස්තාර අංක 2 අනුව මුළු ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය පිළිතුරු ලිවීමට තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 31%ක් පමණ වූ අවම ප්‍රතිශතයකි. ඉන් 50%ක් පමණ ලබා ඇති ලකුණු පරාසය 0-2 අතර වේ. ප්‍රස්තාර අංක 3 අනුව 8-10 තෙක් පරාසය අතර ලකුණු ලබා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 15%ක් පමණි. ප්‍රස්තාර අංක 4 අනුව මෙම ප්‍රශ්නයේ (i) කොටසට 18%ක් පමණ නිවැරදිව පිළිතුරු සපයා ඇත. (ii) කොටසට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 48%ක් පමණි. (iii) කොටසට 31%ක් පමණ පිළිතුරු සපයා ඇත. මෙම කොටසට පිළිතුරු සපයා ඇති ආකාරය විශ්ලේෂණය කිරීමේ දී විෂය කරුණු පිළිබඳ මූලික දැනුම නොමැති බව පෙනී යයි.

මෙම ප්‍රශ්නය සිසුන් වැඩි පිරිසක් පිළිතුරු ලිවීමට තෝරාගෙන නැත. මෙම ප්‍රශ්නය තෝරාගත් සිසුන් (i) කොටසට වැරදි අවබෝධයකින් පිළිතුරු සපයා ඇත. එසේම (ii) කොටසට පිළිතුරු සැපයීමේදී විභාග අපේක්ෂකයන් බොහෝ දෙනෙකු නම් කිරීම පමණක් කර විස්තර කිරීම නොකළ බැවින් සාධන මට්ටම අඩුවී ඇත. (iii) කොටසට පිළිතුරු සපයා ඇති සිසුන් වැඩි ප්‍රමාණයක් අදාළ කරුණු ඉදිරිපත් කර නැත. එබැවින් 11 ශ්‍රේණිය පෙළපොතේ පාඩම් මාතෘකාවට අදාළව සිසුන් කරුණු අවබෝධ කරගත යුතුය.

## 4 ප්‍රශ්නය

**4.** **ඇසළ පොහෝ දින සීල සමාදානයෙහි නිරත වූ සිසු පිරිසට ධර්මදේශනය සඳහා වැඩම කළ ගරුතර ස්වාමීන් වහන්සේ මාතෘකා කෙළේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවයි. ධර්ම දේශනාව ආරම්භ කරමින් උන්වහන්සේ මෙසේ පැවසූහ.**

**"මේ සූත්‍රයේ මුලින් ම ඇතුළත් වන්නේ පැවිද්දකු විසින් අත්හළ යුතු අන්ත දෙකයි. දෙවනුව චතුරාර්ය සත්‍යය දක්වෙනව, තෙවනුව අරි අටහි මග ඉදිරිපත් කරනව."**

(i) **මෙම සූත්‍රයේ සඳහන් අන්ත දෙක ලියන්න.**

(ii) **චතුරාර්ය සත්‍යය ලියා දක්වන්න.**

(iii) **සදාචාර සම්පන්න සමාජයක් සඳහා අරි අටහි මගෙහි සීල ශික්ෂාව ඉවහල් වන අයුරු පහදන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) කාමසුඛල්ලිකානුයෝගය
අත්තකිලමථානුයෝගය

*(එක් නිවැරදි කරුණකට එක ලකුණ බැගින් ලකුණු 02 යි)*

(ii) දුක්ඛ ආර්ය සත්‍යය - දුක
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය - දුකට හේතුව
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය - දුක නැති කිරීම
දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යය - දුක නැති කිරීමේ මග

*(කරුණු දෙකක් නම් ලකුණු 01 යි)*
*(කරුණු තුනක් නම් ලකුණු 02 යි)*
*(කරුණු හතරක් නම් ලකුණු 03 යි)*

(iii) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාව යනු සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

යන මාර්ගාංග තුන යි. සම්මා වාචා යනු වාචික සංවරය යි. හෙවත් වචනයෙන් සිදුවන වැරදි හතරෙන් වෙන්වීම යි. සම්මා කම්මන්ත යනු කායික සංවරය යි. එනම් කයින් සිදුවන වැරදි තුනෙන් වැළකීම යි. සම්මා ආජීව යනු යහපත් දිවි පැවැත්ම යි. එනම් වැරදි වෙළඳාම් පහෙන් වැළකීම ආදී කරුණුවලින් යුක්තව නිවැරදි දිවි පෙවෙතක් ගත කිරීම යි.
මෙම කරුණු අනුගමනය කරන පුද්ගලයන්ගෙන් සමන්විත සමාජය සදාචාර සම්පන්න වේ.

*(පිළිතුර සමස්තයක් සේ සලකා ලකුණු ප්‍රදානය කරන්න)*
*(ලකුණු 05 යි)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය 2 ප්‍රස්තාරයට අනුව 88%ක පමණ පිරිසක් තෝරාගෙන තිබේ. මේ සඳහා හිමි මුළු ලකුණු සංඛ්‍යාව 10කි. මෙම ප්‍රශ්නය සිසුන් වැඩි පිරිසකට පහසු ප්‍රශ්නයක් වී තිබිණි. 3 වන ප්‍රස්තාරයට අනුව 39%ක් සිසුන් ලබා ඇති ලකුණු පරාසය 8-10 වේ. මෙහි 0-2 පරාසය තුළ ලකුණු ලබා ඇත්තේ සිසුන්ගෙන් 13%කි. ප්‍රස්තාර අංක 4 අනුව ප්‍රශ්නයේ (i) කොටසට 74% ද (ii) කොටසට 88% ද (iii) කොටසට 52% ද සාර්ථකව පිළිතුරු සපයා ඇත.

මෙම ප්‍රශ්නය විභාග අපේක්ෂකයන්ට පහසුවෙන් තේරුම්ගත හැකිව තිබුණ නිසා පහසුවෙන් පිළිතුරු සැපයීමට හැකිව තිබිණි. සමස්තයක් ලෙස ලකුණු ලබා ගැනීමේදී ඉහළ අගයක් පෙන්නුම් කළ ප්‍රශ්නයකි.

## 5 ප්‍රශ්නය

**5. (i) සියලු ම බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව මේයැ'යි ගෙනහැර දක්වා වදළ ධම්මපද ගාථාව ලියන්න.**
**(ii) එම ගාථාවේ සඳහන් සියලු ම බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව කුමක් ද?**
**(iii) ඔබේ දිවිමග සරුකර ගැනීමට ඉහත ගාථාවෙන් ලැබෙන මග පෙන්වීම ඇගයීමට ලක් කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානසාසනං
ගාථාව නිවැරදිව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු දෙන්න.
අක්ෂර වින්‍යාසය නොසලකන්න. *(ලකුණු 02 යි)*

(ii) සියලු පව් නොකිරීම ද, සියලු කුසල් ඉපදවීම ද, තම සිත පිරිසිදු කිරීම ද යන මෙය සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනය යි.
*(එක කරුණකට එක ලකුණ බැගින් ලකුණු 03 යි)*

(iii) මෙහි පළමුව සඳහන් වන්නේ සියලු පාපයන්ගෙන් වැළකීම පිළිබඳවයි. එනම් පස් පව් දස අකුසල් ආදියෙන් වැළකීමයි. පස් පව් දස අකුසල් කරන පුද්ගලයා සමාජයේ පරිහානියට පත්වන බව ඉතා පැහැදිලිය. සමාජයේ නින්දා අපහාස ආදියට ද, සිර දඬුවම් ආදියට ද, මානසික අසහනයට ද පත් වේ. මෙසේ වූ විට ජීවිතය නිසරු බවට පත්වේ.
කුසල් යනු යහපත් ක්‍රියාවන් ය. දන්, සිල් භාවනා වඩමින්, පස්පවින් හා දස

අකුසලයෙන් වෙන් වූ පුද්ගලයා මානසික වශයෙන් ශක්තිමත් වන අතර, සමාජයේ කීර්ති ප්‍රශංසා ආදියට පත්වේ. මෙසේ වූ විට දිවි මග සරුවේ.

සිත සියලු ක්‍රියාවන්ට මුල්වේ. පුද්ගලයා පිරිහීමට, නිසරු බවට පත්වන්නේ නොමගට ගිය සිත නිසාය. සිත දමනය නොකළ නිසාය. යමකු සිත දමනය කරන්නේ නම් සියලු යහපත උදා කර ගත හැකිය. නරකට නපුරට යොමු නොවේ. එසේ වූ විට ජීවිතය සෑම අංශයකින්ම සරු වූවක් වේ.

*(පිළිතුරු සමස්තයක් සේ සලකා ලකුණු ප්‍රදානය කරන්න.)*

*(ලකුණු 05 යි)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

2 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ සිසුන්ගෙන් 54%ක ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 10කි. ඉන් 15%ක් පමණ ලකුණු 0-2 අතර පරාසය තුළ ලකුණු ලැබූ අය වෙති. ලකුණු 8-10 අතර ලබාගත් සිසුන්ගේ ප්‍රතිශතය 43%කි. (ප්‍රස්තාර අංක 3)

ප්‍රස්තාර අංක 4හි දැක්වෙන පරිදි මෙම ප්‍රශ්නයේ (i) කොටසට 92%කට ආසන්න අපේක්ෂක පිරිසක් සාර්ථක ලෙස පිළිතුරු සපයා ඇත. මින් පෙනී යන්නේ ධම්ම පදයෙහි ගාථාව වැඩි පිරිසක් නිවැරදිව ලියා ඇති බවයි. නමුත් (ii) කොටසට සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 74%ක පමණ පිරිසකි. මින් පැහැදිලි වන්නේ ගාථාව නිවැරදිව ලියූවත් එහි සඳහන් අනුශාසනාව කුමක්දැයි පැහැදිලි කිරීමට සිසුන් අපොහොසත්ව ඇති බවයි. තවද (iii) කොටසට පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 60%කි. එයින් හැඟෙන්නේ මෙම ගාථාවෙන් දැක්වෙන අදහස් තම එදිනෙදා ජීවිතයට යොදා ගන්නා ආකාරය ගළපා ගැනීමට අයදුම්කරුවන් බොහොමයක් අපොහොසත් වී ඇති බවයි. දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පුරුදු පුහුණු කිරීම ද ඒ සඳහා අවස්ථා සැලසීම ද ගුරුවරයා විසින් ඉටු කළ යුතු වැදගත් කර්තව්‍යයකි.

## 6 ප්‍රශ්නය

**6.** **සාහිත්‍ය රසය මෙන් ම ධර්ම රසය, උපදේශය හා සදාචාරයට මුල් තැන දුන් පද්‍ය සාහිත්‍යයක් අපහට උරුමව පවතී. එසේ ම බණ කථා සාහිත්‍යයක් ලෙස දියුණු වූ ගද්‍ය සාහිත්‍යයක් ද අප සතුව පවතී.**

(i) **උපදේශ සැපයීමේ පරමාර්ථයෙන් ම කෝට්ටේ යුගයේ වීදගම මෛත්‍රී හිමිපාණන් හා සීතාවක යුගයේ අලගියවන්න මුකවෙටිතුමන් ලියූ උපදේශ කාව්‍ය ග්‍රන්ථ දෙක** මොනවා ද?

(ii) **බුද්ධ චරිතය හෝ බුදු දහම හෝ පාදක කොට ලියැවුණු සිංහල ගද්‍ය කෘති තුනක්** ලියන්න.

(iii) **"මහින්දගමනයෙන් ශ්‍රී ලාංකික අප ලැබූ දයාද අතර සිංහල බෞද්ධ සාහිත්‍යය ද වැදගත් එකකි."** පහදන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) ලෝවැඩ සඟරාව
සුභාෂිතය

*(එක් නිවැරදි නම් කිරීමකට එක ලකුණ බැගින් ලකුණු 02 යි)*

(ii) අමාවතුර
ධර්මප්‍රදීපිකාව
බුත් සරණ
දහම් සරණ

සඟ සරණ

සද්ධර්ම රත්නාවලිය

පූජාවලිය

සද්ධර්මාලංකාරය

පන්සිය පනස් ජාතක පොත

*(ඉහත කෘති අතුරින් තුනක් නම් කර තිබේ නම් එකකට ලකුණ බැගින් ලකුණු 03 යි)*

(ii) මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමග අප ලැබූ දායාද අතර ලේඛන කලාව ද වැදගත්වේ. එය පදනම් කර ගෙන අනුරාධපුර යුගයේ සිට ම නිර්මාණය වූ බෞද්ධ සාහිත්‍යය තුළින් බෝසත් සිරිත, බුද්ධ චරිතය, බුද්ධ ධර්මය ආදිය විස්තර විය. මේ සියල්ල තුළින් විශිෂ්ට වූ සිංහල බෞද්ධ සංස්කෘතියක් සකස් වීමෙහිලා පුළුල් අත්තිවාරමක් ද ගොඩ නැගිණි.

*(පිළිතුර සමස්තයක් සේ සළකා ලකුණු ප්‍රදානය කරන්න)*

*(ලකුණ 05)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

අයදුම්කරුවන්ගෙන් 62%ක් පමණ 6 වන ප්‍රශ්නය තෝරාගෙන ඇත. එම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 10කි. අයදුම්කරුවන් අතුරින් 0-2 සහ 3-5 පරාස අතර ලකුණු ලබා ඇති ප්‍රතිශත 31%ක් බැගිනි. (ප්‍රස්තාරය 3) මෙම ප්‍රශ්නයේ (i) කොටස සඳහා අයදුම්කරුවන්ගෙන් 39%ක් ද, (ii) කොටස සඳහා අයදුම්කරුවන්ගෙන් 57%ක් ද, (iii) කොටස සඳහා අයදුම්කරුවන්ගෙන් 51%ක් ද, සාර්ථකව පිළිතුරු සපයා ඇත. බොහෝ දෙනෙකුට ප්‍රශ්නයේ (i) කොටසට අදාළ ලකුණු නොලැබුනේ උපදෙස් කියවා අවබෝධ කර නොගැනීම නිසා අනුපිළිවෙළ වෙනස්ව පිළිතුරු සඳහන් කිරීම හේතුවෙනි.

මෙහි තුන්වන කොටසට පිළිතුරු සැපයීමේදී මහින්දාගමනයෙන් ලද දායාද පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට අවබෝධයක් නැති බව පෙනී යයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකීය උරුමය ඇන හැඳින ගැනීමේ නිපුණතාව සංවර්නය විය යුතුය.

## 7 ප්‍රශ්නය

**7.** **(i) ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා අනගාරික ධර්මපාල බවට පත් වූ අයුරු සැකෙවින් දක්වන්න.**

**(ii) අනගාරික ධර්මපාලතුමාගෙන් සිදු වූ ශාසනික සේවාවන් තුනක් ගෙනහැර දක්වන්න.**

**(iii) අනගාරික ධර්මපාල චරිතයෙන් ශිෂ්‍ය ජීවිතවලට ගත හැකි ආදර්ශ තුනක් පැහැදිලි කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමන්ගේ හා මල්ලිකා හේවාවිතාරණ ළමා තැනීගේ පුතණුවන් වූ ඩේවිඩ් හේවාවිතාරණ ගල්කිස්සේ ශාන්ත තෝමස් වැනි මිෂනාරි පාසල්වලින් මුලදී අධ්‍යාපනය ලැබීය. පසුව පූජ්‍යපාද මිගෙට්ටුවත්තේ ගුණානන්ද ස්වාමින් වහන්සේ වැනි බෞද්ධ පැවිදි පඬිවරුන්ගෙන් බුදු දහම හා පාලි භාෂාවත්, සිංහල භාෂාවත් පිළිබඳ මනා දැනුමක් ලබා ගත්තේය. හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමාගේ ඇසුරෙන් ද බෞද්ධ හැඟීම්, ජාතික හැඟීම් වඩා වර්ධනය කර ගත් අතර, ආර්ය සිංහල සිරිත් විරිත් අගය කළ මොහු, ඩේවිඩ්, යන නාමය අතහැර ධර්මපාල යන නම භාවිතා කළේ, සිංහල බෞද්ධයන් තුළ යම් පෙළඹීමක් ඇති කිරීමටත් ය. *(ලකුණු 02 යි)*

(ii) 1 1891 මහාබෝධි සමාගම පිහිටුවා "බුඩිස්ට්" නම් සඟරාව ආරම්භ කිරීම.
2. බුද්ධගයාවේ බෞද්ධ අයිතිය තහවුරු කිරීම.
3. 1906 දී "සිංහල බෞද්ධයා" පත්‍රය ආරම්භ කිරීම.
4. ලංකාවේ සහ භාරතයේ පමණක් නොව ලෝකයේම නිර්මල බුදු දහම පැතිරවීමට ධර්ම දූත සේවාවේ යෙදීම.
5. ඕල්කොට්තුමා සමග එක්වී බෞද්ධ පාසල් ආරම්භ කිරීම.
6. පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ කටයුතු ඉදිරියට ගෙන යාම.
7. "සරසවි සඳරැස" පත්‍රය ඉදිරියට පවත්වා ගෙන යාමට කැපවී කටයුතු කිරීම.

*(මේ ආදී කරුණුවලින් එක් කරුණකට ලකුණ බැගින් ලකුණු 03 කි)*

(iii) 1 දින චරියාවකට අනුව තම ජීවිතය ගෙන යාම
2. තම පවිත්‍රත්වය ගැන සැලකිලිමත් වන අතරම තමන් පරිභෝග කරන ඇඳ පුටු, වස්ත්‍රාභරණ සියල්ලක්ම පවිත්‍රව තබා ගැනීම.
3. මත් පැන් බීමෙන් වැළකීම.
4. ආර්ය සිංහල නම් භාවිතා කිරීම.
5. ආර්ය සිරිත් විරිත් ගරු කිරීම.
6. සත්‍ය ගරුක වීම.
7. ගවමස් කෑමෙන් වැළකීම.
8. දේශීය සම්පත් හා උරුමයන් ආරක්ෂා කිරීම.
9. හිංසනය පිටු දැකීම.

*(ඉහත සඳහන් කරුණු වලින් තුනක් පදනම් කොටගත් ප්‍රමාණවත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න)*

*(ලකුණු 05 යි)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය 2 වන ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයින් අතුරින් 63%ක් පිළිතුරු සැපයීමට තෝරාගෙන ඇත. ඉන් 20%ක් ලකුණු ලබා ඇත්තේ 0-2 ලකුණු පරාසය තුළය. ප්‍රස්තාර අංක 3ට අනුව 6-7 දක්වා ලකුණු පරාසය ලබා ඇති සිසුන් ප්‍රතිශතය 32%කි. 25%ක් පමණ 8-10 පරාසය තුළ ලකුණු ලබා ඇත. ප්‍රස්තාර අංක 4 අනුව මෙම ප්‍රශ්නයේ (i) කොටසට නිවැරදිව පිළිතුරු සපයා ඇති සිසුන් ප්‍රමාණය 54%කි. (ii) කොටසට 65%ක් සහ (iii) කොටසට 47%ක් වශයෙන් අයදුම්කරුවන් පිළිතුරු සපයා ඇත.

මෙම ප්‍රශ්නය සිසුන්ගෙන් සැලකිය යුතු පිරිසක් පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇත. එහෙත් සිසුන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නොමැති බව පිළිතුරු සපයා ඇති ආකාරයෙන් පෙනී යයි. ප්‍රශ්නයේ (i) කොටසට පිළිතුරු සැපයීමේදී ධර්මපාලතුමා අනගාරික වූ ආකාරය සිසුන් වැඩි පිරිසක් සඳහන් කර නොතිබිණි.

ප්‍රශ්නයේ (iii) කොටසට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අනගාරික ධර්මපාල චරිතයෙන් සිසු ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 3 පමණක් සඳහන් කර ඇති නමුත් එම ආදර්ශ පදනම් කොටගෙන ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කර නැත. මින් පෙනී යන්නේ බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත හදාරා චරිතායනය කර නැති බවයි. මේ සඳහා නිසි මඟ පෙන්වීම හා උපදෙස් ලබාදීමට ගුරුවරුන් කටයුතු කළ යුතුව ඇත.

# III කොටස

## 3.0 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු :-

**පොදු උපදෙස් :**

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

- ⋆ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

- ⋆ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- ⋆ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ⋆ ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.

- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

- ⋆ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස් :**

- ⋆ ගාථා හා උධෘත පාඨ ලිවීමේ දී නිවැරදි අක්ෂර වින්‍යාස සහිතව නිසි පරිදි වචන වෙන් කොට පිළිතුරු ලිවීමට උත්සාහ කළ යුතුය.

- ⋆ චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය, හේතුඵල වාදය වැනි මාතෘකා කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර දහම් කරුණු මතක තබා ගැනීම පිණිස නිරතුරු අභ්‍යාසයේ යෙදිය යුතුය.

## 3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :-

- ★ බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ගුරු භවතුන් යොදවා ඔවුන්ගේ මූලිකත්වයෙන් සිසුන්ට විෂය දැනුම ලබා දීම.

- ★ බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරු දැනුමින් හා සාරධර්මවලින් පෝෂණය විය යුතු අතර සිසුන් තුළ ආකල්පමය හා චර්යාමය වෙනසක් ඇති කළ හැකි ආකාරයේ මඟ පෙන්වීමක් කළ යුතුය.

- ★ විෂය කරුණු ප්‍රායෝගිකව අවබෝධ කර ගැනීමට සිසුන් අසමත් වී ඇති බවක් විද්‍යාමාන වන බැවින් ඒ සඳහා සිසුන් උනන්දු කළයුතු අතර බුද්ධ ධර්ම විෂය හැකිතාක් ප්‍රායෝගිකව ඉගැන්වීම.

- ★ පෙළපොත් හා මූලාශ්‍ර ග්‍රන්ථ පරිශීලනය කිරීමට සිසුන් උනන්දු කළ යුතුය.

- ★ කවි, ගාථා කටපාඩම් කළ යුතුව ඇතත් සිසුන් ඒ සඳහා දුර්වලතා පෙන්වා ඇත. ස්මරණ ශක්තිය නොමැති වීම පොදුවේ දක්නට ලැබෙන දුර්වලතාවයකි. එම දුර්වලතාවය මඟහරවා ගැනීමට වගබලා ගත යුතුය.

- ★ ගාථාවලින් දැක්වෙන අදහස් එදිනෙදා ජීවිතයට යොදා ගත හැකි ආකාරය පිළිබඳව සිසුන්ගේ අදහස් දැක්වීම පොදුවේ දුර්වල මට්ටමක පවතී. එබැවින් දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කළ යුතුව ඇත.

- ★ ධම්ම පදයේ ගාථා නිවැරදිව උච්චාරණය කිරීමටත්, පාලියෙන් ලිවීමටත්, එහි අර්ථය නිවැරදිව ලිවීමටත් ජීවිතයට ආදර්ශ ලබා දීමටත් පුහුණුවක් ලබා දිය යුතුය.

- ★ බෞද්ධ ශාසනික ඉතිහාසය, ශාසනික උරුමය හා කලා නිර්මාණ පිළිබඳව සිසුන් තුළ ඇති අවබෝධය අවම හෙයින් ක්ෂේත්‍ර චාරිකා හා ප්‍රායෝගික වැඩසටහන් සංවිධානය කිරීමේදී විෂය නිර්දේශයට ඇතුළත් කලා නිර්මාණ හා ශ්‍රී ලාංකික උරුමය යන මාතෘකාවලට අදාළව ඒවා සංවිධානය කිරීම.

- ★ අභ්‍යන්තර ඇගයීම් කටයුතුවලදී ව්‍යුහගත රචනා ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම ප්‍රගුණ කළ යුතුය.

- ★ ආගමික වතාවත් නිතිපතා ඉටුකිරීමටත් පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කිරීමටත් දරුවන් උනන්දු කරවීමට දෙමාපියන්ට උපදෙස් දීම.

- ★ බුද්ධ ධර්ම විෂය කමිටු ඇති කිරීම.

- ★ පෙර පොහොය වැඩසටහන් හා ආගමික වතාවත් පැවැත්වීමේදී ගුරුභවතුන්ගේ හා සිසුන්ගේ සහභාගීත්වය නිරතුරුව ලබා දීම.

- ★ පරිගණකය යොදාගෙන පාඩම් සකස් කර ඉගැන්වීම සඳහා බුද්ධ ධර්මය උගන්වන ගුරුවරයාට නිපුණතාව ලබා දීම.

- ★ සිසුන් කියවීම මගින් දැනුම ලබා ගැනීමට උනන්දු කරවීම.